# කීර්ති ශ්‍රී

## සහ

# කන්ද උඩරට විහාරස්ථ ඉඩම්



93
A

අජිත් තල්වත්ත

Rs: 250.00 |

124668

12 DEC 2018

# කීර්ති ශ්‍රී සහ කන්ද උඩරට විහාරස්ථ ඉඩම්

RAJMNLIB

124668

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**අජිත් තල්වත්ත**

B.A (spcial) M.A.(PDN) M.Phil (KLN)

| ප්‍රවේශ අංකය | 124668 |
| --- | --- |
| වර්ග අංකය | 954.93 THA |

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

පුස්තකාලය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මිහින්තලේ

# පෙරවදන

කන්ද උඩරට රාජධානියේ සිංහල රජවරු දකුණු ඉන්දියාවේ මදුරාපුරයේ හින්දු හා තෙළිඟු ජාතික බිසෝවරුන් ගෙන්වා ගැනීම සම්ප්‍රදායක් ඇති කරගත් හෙයින් ක්‍රමයෙන් කන්ද උඩරට රජ මාළිගය තුළ හින්දු හා තෙළිඟු භාෂාවන් ව්‍යවහාර කරන බිසෝවරුන් හා නායක්කාර් වංශික ඥාතින්ගෙන් සමන්විත විය. ඒ සමඟ ම රජ වාසල තුළ ඔවුන් බලවත් පිරිසක් වූ බවට ද සාක්ෂි තිබේ. එහි ප්‍රතිඵලය වූයේ ශ්‍රී ලංකාවේ අවසාන සිංහල නරපතියා වූ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707-1739) රජුගෙන් පසු ක්‍රිස්තු වර්ෂ 1739 දී ශ්‍රී විජය රාජසිංහ රජු රාජ්‍යයත්වයට පත්වීමත් සමඟ මෙරට සිංහාසනයේ උරුමය නායක්කාර් වංශිකයින් අතට පත්වීම ය.

කන්ද උඩරට රාජධානියේ දෙවන නායක්කාර් වංශික රජු වූ කීර්ති ශ්‍රී රාජසිංහ (1747-1782) රජු ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය හා සාහිත්‍ය වර්ධනයෙහි ලා වැදගත් දායකත්වයක් දැක්වූ රජ කෙනෙකි. රජු බුදුදහම කෙරෙහි සමීපවීමෙහි ලා බලපෑ හේතු සාධක සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන කාරණයක් වන්නේ ඒ වන විට කන්ද උඩරට රාජධානියේ දේශපාලන බලය තුළ වංශාධිපති රදලයින්ට හිමිවී තිබූ බලයට අභියෝග කිරීමක් ලෙස බුදුදහම වැළඳ ගැනීම හා එයට අනුගහය දැක්වීමත් බව පැහැදිලි ය. විශේෂයෙන් ම කන්ද උඩරට රාජධානිය ආශ්‍රිත රදල වංශිකයින්ගේ ඥාතීන් රාශියක් ම භික්ෂූන් වහන්සේලා ලෙස කටයුතු කිරීම නිසා බොහෝ භික්ෂූන් වහන්සේලාගේ අනුග්‍රහය රදලයින් කෙරෙහි පක්ෂපාතී වීම හේතුවෙන් නායක්කාර් වංශික රජවරුන්ගේ පාලනයට විවිධ අභියෝග එල්ල විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු මැරීම සඳහා වූ කුමන්ත්‍රණය ද එහි එක් ප්‍රතිඵලයක් වන්නට ඇත. රජවරුන් විසින් අනුගමනය කරන ලද ඇතැම් හින්දු චාරිත්‍ර ද බෞද්ධ භික්ෂූන් රජු කෙරෙහි පවතින අප්‍රසාදයට ද හේතු විය.

දකුණු ඉන්දීය සම්භවයක් සහිත නායක්කාර් වංශික පරපුරකට අයත්වීම හේතුවෙන් බෞද්ධාගම වැලඳ ගත්තා වුවද රදලයින් හා ඇතැම් ඔවුන්ට හිතවත් භික්ෂූන් තුළ රජු කෙරෙහි කිසියම් සැකයක් මෙන් ම අප්‍රසාදයක් ද පවතින්නට ඇත. රජු මැරීමට ක්‍රි. ව. 1760 පමණ ඇතිවූ කුමන්ත්‍රණය ද එහි ප්‍රතිඵලයකි. ඔවුන්ට සිහසුන පිළිබඳ පැවති අයිතිය සම්බන්ධයෙන් රදලයින් හා භික්ෂූන් අතර පැවති අදහස් ද රජු කෙරෙහි දුරස් වීමට බලපෑවේය. බුදුසමයට උපකාර කළ ද එය අවංකව ම සිදුකළ කාර්යයක් ද යන්න සම්බන්ධයෙන් ද ගැටලු එදා උඩරට සමාජය තුළ පවතින්නට ඇති බව සිතිය හැකි වේ.

රදලයින් හා ඔවුන්ට හිතවත් භික්ෂූන් එලෙස සිතුව ද සාමාන්‍ය ජනතාවට ඔහුගේ දමිළ භාවය හෝ නායක්කර් වංශය පිළිබඳ ව ගැටලුවක් නොමැති වූ අතර ඔවුන් රජු බුදුදහමට උදව් උපකාර කරන බෞද්ධ රජකෙනෙකු බව හැඟී යන ලදී. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දිවයිනේ බොහෝ ප්‍රදේශවල තම අනුග්‍රහය යටතේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමෙන් ද, අලුත් ඉදිකිරීම් මගින් ද අපේක්ෂා කරන ලද්දේ ජනතාව අතර ජනප්‍රිය වී ජනහිතවාදී රජකෙනෙකු බවට පත්වීම බව පැහැදිලි ය. රජු අනුග්‍රහ කරන ලද එම ක්‍රියාවලිය සාර්ථක වූ අතර එහි ප්‍රතිඵලය වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු සිංහල වංශික රජ කෙනෙකු තරමට ම ජනතාව අතර ජනප්‍රිය වීමය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු මෙරට බහුතර සිංහල ජනතාවට වඩාත් සමීප වීමෙහිලා එතුමන් තුළ පැවති සිංහල භාෂාව පිළිබඳ වූ මනා දැනුම හේතු වී ඇත. ජනතාව සමඟ කටයුතු කර ජන අවශ්‍යතාව පිළිබඳ ව වටහාගැනීමට රජුට හැකි විය. එහි දී රජුට වැටහී ගිය ප්‍රධාන ම කාරණය වී ඇත්තේ මෙරට රාජ්‍යයත්වය ස්ථාවර කර පවත්වා ගැනීම උදෙසා බුදු දහම සමග සමීප වීමත්, භික්ෂූන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාව ගොඩනගා ගැනීමත් අවශ්‍ය බවය. ජනතාවගෙන් ලබාගත් අදහසක් මත ක්‍රියාත්මක වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු භික්ෂූන් වහන්සේලා කෙරෙහි සමීප වීමට කටයුතු කරන ලදී. බුදුසමය වැලඳ ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහුට බුදුසමයේ ප්‍රබල අනුග්‍රහයෙකු බවට ද පත්වීමට හැකිවිය. යුරෝපීය ආක්‍රමණ නිසා ඒ වන විට බෙහෙවින් බිඳ වැටී තිබූ

ලංකාවේ බුදුදහම යළි නගා සිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම තුළින් ඔහු මහනුවර රාජධානියේ ශ්‍රේෂ්ඨත ම රජෙකු බවට පත්විය.

කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍යයත්වයට පත්වූ සමයේ මෙරට භික්ෂු ශාසනය තරමක පසුගාමීත්වයක් පැවති අතර ම විහාරාරාම බොහෝමයක් ජරාවාසයට පත්විය. බොහෝ විහාරස්ථානවල අධිපතීත්වය සහ ශාසනික දේපළ ආරක්ෂා කළේ ගණින්නාන්සේලා විසිනි. භික්ෂූන් වහන්සේලා කෙරෙහි රජු සමීපවීමේ දී රජුගේ සිත වඩාත් දිනාගැනීමට හැකි වූ වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් මත කීර්ති ශ්‍රී රාජසිංහ රජු මෙරට බුදුදහම නගා සිටුවීමට විවිධ පියවර අනුගමනය කර තිබේ. එහි එක් ප්‍රධාන පියවරයක් වූයේ උපසම්පදාව යළි මෙරට පිහිටුවා සංඝ ශාසනය යළි ස්ථාපිත කිරීමය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු, වැලිවිට සරණංකර හිමියන් විවිධ දුෂ්කරතාවන් හා අභියෝග මැද සිදුකරනු ලබන ශාසනික සේවාව කෙරෙහි පැහැදුණු අතර ඒ නිසාම උන්වහන්සේට ගරු සැලකිලි දැක්වීමට ද පෙලඹුණ. සරණංකර හිමියන් මෙරට යළි උපසම්පදාව ස්ථාපිත කරලීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත්තේ රජු තමන් වහන්සේ කෙරෙහි දැක්වූ ලෙන්ගතුකම හා ගෞරවය බව පෙනේ. බුදුදහම නගා සිටුවීමට කටයුතු කිරීමේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් දිවයින පුරා වෙහෙර විහාර ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කරන ලද අතරතුර දී විහාරස්ථාන ආශ්‍රිත ව බෞද්ධ අධ්‍යාපන ස්ථාන ද ඇති කිරීමට කටයුතු කර තිබේ. ඒ සඳහා සරණංකර හිමියන්ගේ අනුශාසනාවන් ද රජුට ඉවහල් විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මෙම ක්‍රියාපිළිවෙත හේතුවෙන් මෙරට බෞද්ධ අධ්‍යාපනයේ ද නව පුනර්ජීවයක් ඇති විය.

මහනුවර දළඳ පෙරහැර ක්‍රමවත් ආකාරයට සංවිධානය කොට එය ජාතික උළෙලක් බවට පත්කිරීම තුළ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ජනතාව අතර තවදුරටත් ජනප්‍රිය චරිතයක් විය. එතෙක් පැවති දේවාල පෙරහැර වෙනුවට දළඳ පෙරහැර මූලික කරගනිමින් නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන සිව්මහා දේවාල පෙරහැර පිළිවෙළින් ගමන් කරන ආකාරයට සකස් කරන ලද්දේ මෙම රජු විසිනි. රජු විසින් අනුගමනය කරන ලද

සෙසු ධර්ම ශාස්ත්‍රීය සේවාවන් අතර බෞද්ධ පොත පත රචනා කිරීමට දැක්වූ අනුග්‍රහය ද විය. සරණංකර හිමියන් වෙත සංඝරාජ පදවිය පිරිනැමීමෙන් අනතුරුව උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ ඊරියගම හිමියන්ට ලියන පොත් ලබාදී විශුද්ධිමාර්ගය යළි ලිවීමට සහාය ලබා දී ඇත. එම රජුගේ අනුග්‍රහය මත මෙම හිමියන් විසින් සාරාර්ථ සංග්‍රහය, ගාථා සන්නස, අභිසම්බෝධිලංකාරය, මුණිගුණාවලංකාරය, පාලි සංදේශය හා සතර භණවර සන්නස ආදි වශයෙන් වන කෘතින් රාශියක් ලියන ලදී.

රජු විසින් මෙරට බෞද්ධ පුනරුදය යළි ආරම්භ කිරීමේ කාර්යයේ දී ප්‍රධාන වශයෙන් අනුග්‍රහය දැක්වූ විහාර රාශියක් විය. ඒ අතර මහනුවර දළදා මැදුරේ වැඩ සිටින මාළිගය යළි ප්‍රතිසංස්කරණය කිරීම සිදුකොට ඇත. ගංගාරාමය, දෙගල්දොරුව, සූරියගොඩ, බඹරගල මැදවල, ලංකාතිලකය වැනි විහාර පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණයට ලක්කිරීම වැදගත් කොට සැළකිය හැකි ය. දඹුල්ල ලෙන් විහාරය ආශ්‍රිත ව සිදුකළ කාර්යයන් ද මෙම රජුගේ බෞද්ධාගමික සංවර්ධනය අතිශය වැදගත් විය. විශේෂයෙන් ම දඹුලු ලෙන් විහාරයේ අලුත් මහා විහාරය එම රජු විසින් ම කරවා ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ප්‍රතිමාවක් එම විහාරයේ ඉදි කෙරෙනුයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. තන්ද උඩරට රාජධානිය පැවැති මහනුවර ප්‍රදේශයෙන් බැහැර වූ සතර කෝරලය, සත් කෝරලය ආශ්‍රිත ව මෙන් ම පහතරට ප්‍රදේශයේ ද වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජු මැදිහත් වී තිබේ. මැද්දෙපොළ, මඩවල, දඹදෙණිය, කළුන්දාව, බඩගමුව, රිදී විහාරය, වරාවල, ගිණිගත්පිටිය, මුතුගල, හලඹගල, වේරගොඩ, තිස්සව, කඳුලව, ඇත්නෝරුව, මාවනපොල, අරත්ත, දෙවනගල, දියසුන්නත, වලල, අළුවිහාරය, හුරිකඩුව, වෙළගම, මහියංගණය, මැදවල, හක්මන පල්ලාවල, ඉසුරුමුණිය ආදි ස්ථාන රැසක විහාරස්ථාන ප්‍රතිසංස්කරණයට දායකත්වය සපයා ඇත.

විහාරස්ථාන නගා සිටුවීමේ කාර්යයේ දි සන්නස් හා තුඩපත් මගින් ඉඩකඩම් විශාල ප්‍රමාණයක් විහාරස්ථාන වෙත පූජා කිරීමට කටයුතු කර ඇත. විශේෂයෙන් ම විහාරස්ථාන ආශ්‍රිත ව පැවති රාජකාරි ක්‍රම විධිමත් කිරීමට ද කටයුතු කර තිබූ අතර එලෙස රාජකාරියේ නියුතු වූ පිරිස් හට දිවෙල් ගම් හා

පමුණුගම් ප්‍රධානය කිරීම ද සිදුකර තිබේ. තම අගනුවර ආශ්‍රිත ප්‍රදේශයේ පමණක් නොව ශ්‍රී ලංකාවේ ස්ථාන රාශියකම වෙහෙර විහාර ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය තුළින් හෙතෙම බුදුදහමට අනුපමේය සේවාවක් කළ ජන හිතවාදි රජ කෙනෙකු ලෙසට ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇත. එහි ප්‍රතිඵලය වූයේ පොදු ජනතාව අතර නායක්කාර් වංශිකයෙකු යන අදහස ඇති නොවීම ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් අනුගමනය කරන ලද මෙම ක්‍රියාවලිය මෞර්ය අශෝක රජු අනුගමනය කරන ලද දේශපාලනික ක්‍රියාවලියට බෙහෙවින් සමාන බව ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් වැනි වියතුන් පවසා ඇත්තේ එබැවිනි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයේ, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අජිත් තල්වත්තගේ කීර්ති ශ්‍රී රාජසිංහ සහ කන්ද උඩරට විහාරස්ථ ඉඩම් කෘතිය මගින් ඉදිරිපත් කෙරෙන කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී මහනුවර විහාරාරාමශ්‍රිත ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ ගංගාරාමය, සූරියගොඩ, ලංකාතිලකය, දෙගල්දොරුව, බඹරගල, සහ මැදවල ආදි විහාරස්ථාන සඳහා ඉඩකඩම් වඩාත් ක්‍රමානුකූල ව ප්‍රදානය කර තිබෙන බවකි. විශේෂයෙන් ම එම කටයුතු වඩාත් නිරවුල් ව කරගෙන යාම පිණිස ඒ හා සම්බන්ධ වූ රාජකාරි හා සේවා කටයුතු ද නිසි පරිදි පනවා තිබෙන බව පැරණි ලේඛන ඇසුරින් පැහැදිලි වේ. මෙම කෘතිය මගින් ඒ පිළිබඳ ගැඹුරු විමර්ශනයක් සිදුකිරීමට කතුවරයා සමත්ව ඇත. මෙම විෂය පථය කෙරෙහි උනන්දුවක් දක්වන පාඨකයින් සියලු දෙනාගේම අවධානය යොමු විය යුතුය.


ආචාර්ය චන්දන රෝහණ විතානාච්චි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පුරාවිද්‍යාව සහ උරුමකළමනාකරණ අධ්‍යයනාංශය
පීඨාධිපති
සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# පටුන


1 කන්ද උඩරට රාජධානියේ කීර්ති ශ්‍රී රාජසිංහ සමය 15

2 කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ මහනුවර ප්‍රදේශයේ විහාර ඉඩම් 40

3 විහාර හා සම්බන්ධ පංගු 47

4 දෙගල්දොරුව විහාරය 49

5 ගංගාරාම විහාරය 58

6 මැදවල විහාරය 72

7 බඹරගල රජමහා විහාරය 76

8 ලංකාතිලක රජමහා විහාරය 79

9 සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම විහාරය 89

10 විහාරස්ථානවල රාජකාරිය සහ තිලපත්ගුකරුවෝ 94

නිගමනය 102

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 104